**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2023**

**--------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ (''ආයතනය'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවමත් භාවිතයේ පවතින පිරිවැය රු.60,794,015 ක් වූ දේපල පිරියත හා උපකරණ වල දළ ධාරන අගය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | 2023.12.31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති ජංගම නොවන වත්කම් වල වටිනාකම රු.63,095,588 ක් වන බව පිළිගත හැක. කෙසේ වෙතත් මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර සකස් කර ඇත. ප්‍රමිතියේ (SLPAS) 49 ඡේදයට අනුව සියළුම ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමින් පවතී. එම කාර්ය නිම වූ පසු සියළුම ජංගම නොවන වත්කම් වල ධාරන අගය මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමට කටයුතු කරනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම් වල දළ ධාරන අගය හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක වන පුහුණු මධ්‍යස්ථාන 03 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී ලබා දුන් රු. 10,564,786 ක මුදල ආදායම් ලෙස හා වැය කරන ලද රු. 5,534,456 ක් වියදම් ලෙස හඳුනා නොගෙන, වැය කර ඉතිරි මුදල වූ | මෙම ව්‍යාපෘතිය සඳහා ලද රු.10,564,786 ක මුදල ආයතනයෙහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ආදායමක් නොවන බැවින් ආදායමක් ලෙස ගිණුම් ගත කර නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතියෙහි ගනුදෙනු පාලන ගිණුමක් මගින් (Control Account) ගිණුම් ගත කර ඇත. | සියළු ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.5,030,330 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. | | |
| (ආ) | 2020, 2021 හා 2022 යන වර්ෂයන් තුලදී බැංකුවට සෘජුවම ලද එකතු වටිනාකම රු 341,685 ක් වූ තැන්පතු හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශිෂ්‍යයන් විසින් සිදු කරන සෘජු ප්‍රේෂණ සඳහා ඔවුන් ගේ ජාතික හැඳුනුම්පත් අංක, දුරකථන අංක ආදී විස්තර ඇතුලත් කරන ලෙස උපදෙස් ලබාදී ඇති අතර, එමගින් බැංකුව වෙත සිදු කරන සෘජු ප්‍රේෂණ හඳුනාගෙන ගිණුම් ගතකිරීමට හැකියාව ලැබෙනු ඇත. | සෘජු බැංකු තැන්පතු හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ) | බදුල්ල පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල කුලියට ගැනීමේ දී 2023 ඔක්තෝබර් 12 දින ගෙවූ රු.600,000 ක තැන්පතු මුදලින්, සමාලෝචිත වර්ෂයට අදාල කුලී වියදම වූ රු.150,000 වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | එය 2024 වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයට අදාල වියදම් හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විගණනයේ ගණනය කිරීම් අනුව රු.3,908,650 ක් වටිනා මෘදුකාංග සහ මෘදුකාංග සංවර්ධන වත්කම් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය වියයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.3,554,560 ක් ලෙස රු.364,090ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂය තුලදී පරිගණක මෘදුකාංගද ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බැවින් ප්‍රත්‍යාගණන අගය පදනම් කර ගිණුම් වල ගැලපීමට කටයුතු කරනු ඇත. | ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රත්නපුර ආයතන පරිශ්‍රයේ පවතින විදුලි ජනක යන්ත්‍රයේ සේවා ගිවිසුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.148,680 ක මුදල සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මෙම මුදල පෙර වර්ෂ ගැලපීමක් ලෙස 2024 අවසන් ගිණුම් තුලින් ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. | වර්ෂයේ වියදම් හඳුනා ගෙන නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,796,846 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.5,319,778 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,116,624 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.7,135,428 කින් හා ප්‍රාග්ධන ආයෝජන වියදම් රු. 9,699,956 කින් වැඩි වුවද පාඨමාලා ආදායම් රු.15,291,825 කින් හා භාණ්ඩාගාර ප්‍රදාන රු.10,441,478 කින් ඉහල යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩිපුර ගෙවූ වැටුප් ශේෂය තුල වූ නිලධාරීන් 04 දෙනකුගෙන් වාරික වශයෙන් අයකරගත යුතු එකතුව රු.466,762 ක් වර්ෂ 07 ක සිට අය නොවී පැවතිණි. | මෙම නිළධාරීන් 04 දෙනා දැනට ආයතනයෙන් ඉවත්ව ගිය නිළධාරීන් වන අතර ඔවුන් ගෙන් දෙදෙනෙක් වාරික වශයෙන් ගෙවීම් කිරීම සඳහා එකඟතාවය ප්‍රකාශ කර ඇති අතර අනෙක් දෙදෙනා ගෙන් අය කර ගතයුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර අදාළ නෛතික කටයුතු සිදු වෙමින් පවතී. | අයකරගත යුතු වැටුප් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනාගත සේවක ඉවත්ව යාමකදී ගෙවිය යුතු පාරිතෝෂිත වැඩි ප්‍රතිලාභ ලැබෙන ප්‍රභවයක ආයෝජනය කලයුතු වුවත්, ඒ සඳහා කටයුතු නොකර රු.3,304,898 ක් වූ සේවක පාරිතෝෂිත ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. | මෙම පාරිතෝෂිත අරමුදල ස්ථාවර තැන්පත් ගිණුමක සහ ඉතුරුම් ගිණුමක පවත්වා ගෙන යන අතර හදිසි සේවක ඉවත්වීමකදී අරමුදල් හුවමාරු කිරීම සඳහා ඉතුරුම් ගිණුමකද පවත්වා ගෙන යනු ඇත. කෙසේ වෙතත් එම ඉතුරුම් ගිණුමෙන් කොටසක් ස්ථාවර තැන්පතු ගිණුමක් වෙත මාරු කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විමසා ලැබෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කරමි. | වැඩි ප්‍රතිලාභ ලැබෙන අයුරින් පාරිතෝෂිත ආයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවෙහි ඇති මැණික් විභව ස්ථාන පිලිබඳ තොරතුරු සමීක්ෂණය කර එම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ එම | මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘතිය හරහා අප ආයතනය මඟින් හඳුනා ගන්නා ලද නව මැණික් විභව ප්‍රදේශ කැණීම් සඳහා යොමුකිරීම වෙනුවෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු ඇසුරින් පතල් කැනීම් කටයුතු සඳහා ඉඩම් හිමියන් යොමුකිරීම මූලික අරමුණු ඇතිව ආරම්භ කරන ලද "ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීම් ව්‍යාපෘතිය" සඳහා 2009 සිට 2023 දක්වා රු.30,589,687 ක වියදමක් දරා පර්යේෂණ පවත්වා පර්යේෂණ වාර්තා නිකුත් කර තිබුනද මෙම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග විධිමත් එකගතාවයකට එළඹීමට අසමත් වීම හේතුවෙන් පර්යේෂණ වල ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අධිකාරිය වෙත ලබාදෙන ලදී. මෙම කටයුතු ඉදිරියට ගෙනයාමෙහි ලා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය දක්වන පසුගාමී ස්වභාවය අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට බඳුන්වූ අතර මෙම ඉඩම් කර්මාන්තගත කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හරහා කටයුතු සලසාගන්නා ලෙස එහිදී උපදෙස් ලබාදෙන ලදී. | කළ යුතුය. |
| (ආ) | ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය 136 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 64 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයෙන් 72 ක්, එනම් අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 52 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තුළ ඇතුලත් දේශක තනතුරු 04 ක් ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිලධාරී තනතුරු 06 ක් හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරු 09ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පර්යේෂණ හා පුහුණු ආයතනයක් වශයෙන් ආයතනයේ ක්‍රියාත්මක වීමට මානව සම්පත් ගැටලුව බාධාවක්ව තිබුණි. | මෙම පුරප්පාඩු පිරවීම පිළිබඳව අමාත්‍යාංශය වෙතින් දිගින් දිගටම විමසුම් සිදු කලද ජාතික ප්‍රතිපත්තිමය තීරණ අනුව බඳවාගැනීම් සිදු කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 2024.03.15 දින මෙම පුරප්පාඩු පිරවීම සඳහා අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගෙන ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අනුමත ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යයන් 31 ක් අතුරින් කාර්යයන් 14 ක් සඳහා එකතුව රු.මිලියන 20.675 ක අයවැය ප්‍රතිපාදන ලැබී තිබුනද තත්‍ය වියදම රු.මිලියන 9.094 ක් වීම හේතුවෙන් මෙම කාර්යයයන් 14 හි මූල්‍ය ප්‍රගතිය සියයට 44 ක් විය. | ක්‍රියාකාරී සැලැස්මෙහි පුහුණු අංශයට අදාලව ප්‍රතිපාදන ඉතිරි වීමට, රත්න විද්‍යාව හා ස්වර්ණාභරණ ඩිප්ලෝමා පාඨමාලාවේ බොහෝ දේශන මාර්ගගතව ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික පිරිවිතරයන්ට අනුව මිල කැඳවීම් සිදු කරනු ලැබුවද අපේක්ෂිත පිරිවිතරයන්ට අදාලව මිල පත්‍රිකා යොමු නොවීම, වර්ෂයේ දෙවන අර්ධයෙහි අධි වර්ෂාව ඇද හැලීම, පළුදු සහිත මැණික් අවශ්‍ය සාම්පල | ක්‍රියාකාරකම් සඳහා බලපෑ හැකි සියළු සාධක සලකා බලමින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කල යුතු අතර සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් ඉටු කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රමාණය පරිත්‍යාගයක් වශයෙන් ආයතනය වෙත ලබා ගැනීමට හැකිවීම නිසා ඒ සඳහා පිරිවැයක් දැරීමට සිදු නොවීම, සංශුද්ධ තත්ත්වයේ රසායන ද්‍රව්‍යවල හිඟකම මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම, නීතිපති දෙපාර්තමේන්තු උපදෙස් ලැබීම ප්‍රමාද වීම සහ රසායනාගාර ප්‍රතීතනය සඳහා කාර්යයන් වර්ෂයේ අවසානය වන විට සිදු කර ගැනීමට නොහැකිවීම ආදී කරුණු බලපා ඇත. | |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේ රු.14,204,402 ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි සමාලෝචිත වර්ෂය තෙක් ඉදි කිරීම් සිදු කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වසර 07 කට අධික කාලයක සිට එම ඉඩම ඌණ උපයෝජිතව පැවතුණි. | ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම හා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම හා ගොඩනැගිලි සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම සඳහා 2024 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | අදාල කාර්යය ඇතුලත්ව ප්‍රසම්පාදන කාලසටහන යාවත්කාලින කර ඒ අනුව කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |